කරච්චි ප්‍රාදේශීය සභාව

කිලිනොච්චි දිස්ත්‍රික්කය

----------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 06 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් 08 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට කරච්චි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී යොදා ගනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාලෝචිත වර්ෂයේ ගිණුම් ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වීම

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී රාජ්‍ය අංශයේ ගිණුම් කරණ ප්‍රමිති වලට අනුකූලව සකස් කළ බවට මූල්‍ය ප්‍රකාශන වල සහතික කර නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශන සකස් කර නොතිබුණි.

1.3.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2010 සහ 2011 වර්ෂ වෙනුවෙන් ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතින් ලැබිය යුතු එකතුව රු. 3,532,315 ක් වන මුද්දර බදු ගිණුම්වලට ගෙන නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදල අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) එකතුව රු. 155,202 ක් වූ ස්ථාවර තැන්පතු පොලී ආදායම් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබීම හේතු කොටගෙන සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) 2014 වර්ෂයේදී නිල වාහනයක් අණතුරකට පත්වීමෙන් සිදුවී තිබූ රු.1,214,986 ක පාඩුවක් වර්ෂ දෙකකට වැඩි කාලයක් ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුලදී ඉටු කරන ලද ප්‍රාග්ධන වැඩ හතරක වටිනාකම වූ රු.1,322,038 ක මුදල ප්‍රාග්ධන ගත කර නොතිබුණි. එබැවින්, ස්ථාවර වත්කම්වල වටිනාකම ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි.

1.3.4 ගෙවිය යුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂය තුලදී අයකර ගන්නා ලද එකතුව රු. 192,740 ක් වූ මුද්දර බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු (NBT) දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ප්‍රේක්ෂණය නොකර 2015 දෙසැම්බර් 31 දිනට විවිධ තැන්පත් ගිණුමේ රදවා තිබුණි.

1.3.5 ප්‍රමාණවත් සාක්ෂි නොමැතිවීම

-----------------------------------

භාණ්ඩ ලැබීමේ සටහන් (GRN) සහ ප්‍රමාණ පත්‍රිකා වැනි සාක්ෂි නොමැතිවීම හේතු කොටගෙන සමාලෝචිත වර්ෂයට අදාල එකතුව රු. 638,825 ක ගෙවීම් දෙකක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

1.3.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකුල නොවීම

----------------------------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකුල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකුල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත. | |
| (i) කොටස III වගන්තිය 24 | ආණ්ඩුවේ ගැසට්පත්‍රයෙන් ප්‍රාදේශීය සභාව ස්ථාපිත කර වර්ෂ තුනක් ඇතුලත ප්‍රාදේශීය සභාව සතු මහා මාර්ග සහ පටු මාවත් පිළිබඳ විස්තර ලේඛණයක් ප්‍රසිද්ධ කර නොතිබුණි. |
| (ii) කොටස (iv) වගන්තිය 108 සහ 132 (ඒ) | (i) අදාල අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලිඛිතව ලබා නොගෙන සමාලෝචිත වර්ෂය තුලදී රු. 4,765,602 ක පිරිවැය වන ප්‍රජා මධ්‍යස්ථාන 11 ක් සභා අරමුදල උපයෝගි කරගෙන ඉදිකර තිබුණි. |

(ii) අදාල අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලිඛිතව ලබා නොගෙන සමාලෝචිත වර්ෂය තුලදී රු. 558,325 ක් වටිනා පුවත්පත් මිලදී ගැනීම සඳහා අරමුදලින් වියදම් දරා තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති -1988

----------------------------

| | | |
|---|---|---|
| (i) | අධිකාරිය iii රීතිය 66 | එකතුව රු. 5,529,084 ක් වූ හිඟ ආදායම් අයකර ගැනීම සඳහා සභා ලේකම් විසින් කටයුතු කර නොතිබුණි. |
| (ii) | අධිකාරය v රීතිය 140 | එකතුව රු. 27,000 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම පියවීම සඳහා වර්ෂයකට වැඩි කාලයක් කටයුතු කර නොතිබුණි. |
| (iii) | අධිකාරය ix රීතිය (178(1) | සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන කමිටු පත්කර නොතිබියදී සභාව සතු වෙළඳ සැල් 18 කින් සහ වත්කම්වලින් රු.15,292,930 ක ආදායමක් ලැබී තිබුණි. |
| (iv) | අධිකාරය viii රීතිය 178 (3) | ප්‍රජාමූල සංවිධාන සහ ග්‍රාමෝදය මණ්ඩලය විසින් ඵලදායි ආකාරයෙන් ඉටුකරන ලද කොන්ත්‍රාත්තු පිළිබඳ ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |
| (v) | අධිකාරය viii රීතිය 178 (5) | සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ලේඛන ගත තැපෑලෙන් ලංසු පත්‍රිකා යවා නොතිබුණි. |
| (vi) | අධිකාරය ix රීතිය 180 | මුදල් හෝ තොග සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ගෙන් ආරක්ෂිත තැන්පතු ලබාගෙන නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි

| | | |
|---|---|---|
| (i) | මු.රෙ. 104 | සභාව සතු වාහනයක් අනතුරට පත්වීම හේතු කොටගෙන සිදුවී ඇති රු. 1,214,986 ක අලාභයට හේතු අනාවරණය කර ගැනීමට සහ වගකීම නිශ්චය කිරීම සඳහා මූලික පරීක්ෂණ හා අවසාන පරීක්ෂණ සිදුකර නොතිබු බව නිරීක්ෂණය විය. උක්ත අනතුරු සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා වෙත දන්වා නොතිබුණි. |
| (ii) | මු.රෙ. 571 | එකතුව රු. 1,631,597 ක් වන කල් ඉකුත්වී ඇති තැන්පතු 38 ක් සම්බන්ධයෙන් අවුරුදු දෙකකට වැඩි කාලයක් ඵලදායි ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 49,948,805 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 32,060,433 ක් විය. ඒ අනුව, වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම රු. 17,888,372 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
-------------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ මූල්‍ය ප්‍රතිඵලය පෙර වර්ෂයේ අනුරූප ශුද්ධ අතිරික්තය වූ රු. 556,013 සමඟ සැසඳීමේදී රු. 17,095,288 ක ශුද්ධ අතිරික්තයක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අවසාන මූල්‍ය ප්‍රතිඵලය රු. 16,539,275 කින් වර්ධනය වී ඇති බව පෙන්නුම් කෙරිණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

---------------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂට අදාල සභාවේ කාරක ප්‍රාග්ධනය වූ රු. 93,449,565 පෙර වර්ෂයේ අනුරූපිකාරක ප්‍රාග්ධනය වූ රු. 77,877,218 සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 15,572,347 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.4 ආදායම් පරිපාලනය
-------------------------

2.4.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්
-----------------------------------------------------------------

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 150,000 | 1,500 | - |
| බදු හා බදු කුලී | 34,498,854 | 29,365,424 | 5,529,084 |
| බලපත්‍ර ගාස්තු | 8,155,500 | 7,338,767 | - |
| සේවා ගාස්තු | 4,520,210 | 4,861,890 | - |
| වරෙන්තු පිරිවැය, දඩ සහ අයකිරීම් | 14,202,000 | 14,861,890 | - |
| වෙනත් ආදායම් | 9,536,800 | 13,086,361 | 22,139,623 |

| | | | |
|---|---|---|---|
| ආදායම් ප්‍රදාන | 33,345,132 | 40,598,375 | - |
| එකතුව | --------------- | ----------------- | -------------- |
| | 104,408,496 | 109,791,511 | 27,668,707 |
| | ========= | ========= | ======== |

2.4.2 වරිපනම් හා බදු

-------------------

සමාලෝචිත වර්ෂයේ දේපල තක්සේරු බදු සම්බන්ධ තක්සේරු රෙජිස්ටරය සභාව විසින් නඩත්තු කර නොතිබූ අතර වරිපනම් හා බදු අයකරගෙන නොතිබුණි.

2.4.3 සන්නිවේදන කුළුනු ගාස්තු

-------------------------------

2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ නියමයන් ප්‍රකාරව සහා බලප්‍රදේශය තුල ඉදිකර ඇති සන්නිවේදන කුළුණු 05 කට අදාල ගාස්තු අයකර ගැනීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බව නිරික්ෂණය විය.

2.4.4 මුද්දර ගාස්තු

----------------

වර්ෂ 01 සිට වර්ෂ 04 දක්වා වූ කාල පරාශයක් තුළ ඉඩම් රෙජිස්ටාර් ජනරාල් වරයාගෙන් අය විය යුතුව පවතින එකතුව රු. 12,368,038 ක මුද්දර ගාස්තු අය කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරන අකාර්යක්ෂමතා

-------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) උතුරු පළාතේ පළාත් පාලන කොමසාරිස් වරයා විසින් ප්‍රදානය කරන ලද වාහන 33 කට අදාල හිමිකම වර්ෂ 01 සිට වර්ෂ 05 ක කාල පරිච්ඡේදයක් තුලදී සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 112 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 107 ක් විය. එම නිසා සභාවේ පුරප්පාඩු තනතුරු 11 සම්පූර්ණ කර නොතිබූ අතර එය සභාවේ කටයුතු වලට බලපා තිබුණි. එමෙන්ම සේවකයන් 06 දෙනෙකු වැඩිපුර බඳවාගෙන තිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

------------------------------

සභාව සතු වාහන 07 ක් වර්ෂයකට වැඩි කාලයක් භාවිතා කර නොතිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කිලිනොච්චි පුස්තකාල ගොඩනැගිල්ලේ නිම නොවූ වැඩ සඳහා රු. 15,342 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) කිලිනොච්චියේ පිහිටි මහජන පුස්තකාලයේ අළුත්වැඩියා කටයුතු සඳහා රු. 22,236 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

3.4 ව්‍යාපෘති ප්‍රමාද වීම

----------------------

සමාලෝචිත වර්ෂය තුලදී සිදු කරන ලද ව්‍යාපෘති 105 ක් වැඩ නිම නොවී තිබියදී විවිධ ණය හිමියන් යටතේ රු. 34,363,313 ක් ප්‍රතිපාදන සලසා තිබු අතර ගිණුම්වල වියදමක් වශයෙන් පෙන්වා තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

සභා බල ප්‍රදේශයෙන් ඉවත් කරන ලද කැලි කසල පිළිස්සීම සහ පසවලින් යට කිරීම යන ක්‍රියා මාර්ග පමණක් සභාව විසින් අනුගමනය කර තිබුණු අතර කොම්පෝස්ට් සහ ප්‍රතිචක්‍රීයකරන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

------------------------------------------

4.1 අයවැය පාලනය

--------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී අයවැය ගත වියදම් සහ තත්‍ය වියදම් අතර රු. 5,634,624 සිට රු. 159,450 ක් දක්වා වූ පරාශයක විචලනයක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල අයවැය ඵලදායි ආකාරයට භාවිතා කිරීම සඳහා සකස් කර නොතිබූ අතර ඇස්තමේන්තු නිසි පරිදි සැලසුම් කර වැඩ සටහන් ගත කර නොතිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායම් සහ තත්‍ය ආදායම් අතර රු. 7,253,243 සිට රු. 148,500 ක පරාශයක විචලනයක් පැවතුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

----------------------------------------------

2009 ජූනි 09 දිනැති අංක DMA/2009(i) දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්ගේ විගණන හා කළමනාකරණ චක්‍රලේඛයේ විධිවිධාන අනුව සභාවේ කටයුතු වඩාත් ඵලදායි ආකාරයෙන් ඉටු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් පැවැත්විය යුතුය. කෙසේ වුවද එකම රැස්වීමක් වත් පවත්වා නොතිබුණි.

5. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

i. හිඟ ආදායම් අයකර ගැනීම
ii. වාහන උපයෝජනය
iii. කොන්ත්‍රාත් පාලනය
iv. ආදායම් ලේඛන
v. සේවක මණ්ඩල අධීක්ෂණය.